# WEATHER FORECAST FOR 03rd May 2019
## (Issued at 1200 noon on 02nd May 2019)

**The Extremely Severe Cyclonic Storm 'FANI' (pronounced as FONI) over West-central Bay of Bengal to the Northeast of Sri Lanka, was located near latitude 16.2N, Longitude 84.6E at 08.30 a.m. of 02nd May 2019, about 880 km northeast of Jaffna. It is likely to move north-northeastwards while moving away from the island, hence the affect from this system to the island will gradually reduce.**

Strong winds up to 60 kmph can be expected over the island, particularly in Central hilly areas, Northern, North central, North-western and Southern provinces and in Trincomalee districts.

Showers or thundershowers will occur at times over Sabaragamuwa, Central, Southern, Western and North-western provinces. Heavy falls about 100 mm can be expected at some places in the above areas.

Showers or thundershowers may occur at several places after 2.00 p.m. in Easter and Uva provinces and in Polonnaruwa district.

**General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regards.**

මධ්‍ය-බටහිර බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පවතින අතිශයින් චණ්ඩ සුළි කුණාටුව ('ෆොනි') මැයි 02 වන දින පෙ.ව. 08.30 වන විට යාපනය සිට ඊසාන දෙසින් කි.මී. 880 පමණ දුරින් උතුරු අක්ෂාංශ 16.2 ත් නැගෙනහිර දේශාංශ 84.6 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය දිවයිනෙන් ඉවතට ගමන් කරමින් උතුරට බරව ඊසාන දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ. මේනිසා මෙම පද්ධතියෙන් දිවයිනට වන බලපෑම ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

දිවයින හරහා විශේෂයෙන් මධ්‍යම කඳුකර ප්‍රදේශ වලත් උතුරු, උතුරුමැද, වයඹ සහ දකුණු පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මි. 60 දක්වා තද සුළං බලාපොරොත්තුවේ.

දිවයිනේ සබරගමුව, මධ්‍යම, දකුණු, බස්නාහිර සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට මි.මී.100 පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැක.
නැගෙනහිර සහ ඌව පළාත්වලත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේත් තැනින් තැන සවස 2.00 න් පසු වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 02nd May 2019)

**The Extremely Severe Cyclonic Storm 'FANI' (pronounced as FONI) over West-central Bay of Bengal to the Northeast of Sri Lanka, was located near latitude 16.2N, Longitude 84.6E at 08.30 a.m. of 02nd May 2019, about 880 km northeast of Jaffna. It is likely to move north-northeastwards while moving away from the island towards the Odisha coast of India.**

Showers or thundershowers will occur at times in sea areas extending from Puttalam to Pottuvil via Colombo and Galle and heavy showers are likely at some places.

Winds will be South-westerly and speed will be 35-45 kmph and it can increase up to 60 kmph at times over the sea areas around the island.

Wind speed will be 50-60 kmph and wind speed can increase up to 70 kmph at times in the deep sea areas from Mannar to Trincomalee via Kankasanturai and in the sea area extending from Hambantota to Batticaloa via Pottuvil. **Naval and fishing communities are requested to be vigilant in this regards.**

Wind speed can increase up to 150-160 kmph, gusting up to 200 kmph in the sea areas within 300km from the center of the above system.

**There is a possibility that near shore sea areas off the coast extending from Mannar to Pottuvil via Colombo and Galle, may experience surges due to the effect of swell waves, having 2.5-3.5 m height (This is not for land area) from 02nd to 04th May 2019.**

**Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date: 2019/05/02
Time: 1232 hrs
D (Ops)/DO/ADO

<u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>
<u>2019 මැයි මස 02 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදී.</u>

මධ්‍ය-බටහිර බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පවතින අතිශයින් චණ්ඩ සුළි කුණාටුව ('ෆොනී') මැයි 02 වන දින පෙ.ව. 08.30 වන විට යාපනය සිට ඊසාන දෙසින් කි.මී. 880 පමණ දුරින් උතුරු අක්ෂාංශ 16.2 ත් නැගෙනහිර දේශාංශ 84.6 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය දිවයිනෙන් ඉවතට ගමන් කරමින් උතුරට බරව ඊසාන දෙසට ගමන් කර ඉන්දියාවේ ඔඩිස්සා වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අනුමාන කෙරේ.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර ඇතැම්  මුහුදු ප්‍රදේශ වල තද වැසි ඇති විය හැක.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 35-45 පමණ වේ. සුළගේ වේගය විටින් විට පැ.කි.මී 60 දක්වා වැඩි විය හැක.

මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා සහ හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකළපුව දක්වා වන ගැඹුරු මුහුදු ප්‍රදේශවල විටින් විට හමන පැ.කි.මී 50-60 දක්වා වන සුළං බලාපොරොත්තු වන අතර විටින් විට හමන පැ.කි.මී 70 දක්වා වන ප්‍රහාරාත්මක සුළං සමඟ මුහුදු ප්‍රදේශ ඉතා රළු වේ. පිලිබඳ අවධානය යොමුකරන ලෙස ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

සුළි කුණාටු පද්ධතියේ කේන්ද්‍රයේ සිට කි.මී. 300 දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී 150-160 දක්වා වන අතර විටින් විට පැ.කි.මී 200 දක්වා වැඩි විය හැක.
මැයි මස 02 වන දින සිට 04 වන දින දක්වා මන්නාරම සිට කොළඹ සහ ගාල්ල හරහා පොතුවිල් දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශ වල මුහුදු රළ මීටර්. 2.5-3.5 ක් පමණ ( මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩබිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/05/02
Time : 1232 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE